**ඌව පළාතේ පළාත් සහා පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන්**
**ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම**
**සඳහා වන විවෘත තරඟ විභාගය - 2023**

ඌව පළාතේ පළාත් සහා පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ඌව පළාතේ ස්ථිර පදිංචි මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2023.09.18 දින වේ.

**01. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

1.1 අයදුම්කරු / අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

1.2 අයදුම්කරු / අයදුම්කාරිය ඌව පළාතේ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඇති පුරවැසියෙකු විය යුතුය. (පූර්වාසන්න වසර තුනක පදිංචිය සනාථ කරන ඡන්ද හිමි නාමලේඛන උධෘත සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ඌව පළාතේ ස්ථිරව පදිංචිව සිටින එහෙත් ඌව පළාතේ වසර 03ක පූර්වාසන්න ස්ථිර පදිංචිය තහවුරු කළ නොහැකි අයදුම්කරුවන් තම කලත්‍රයාගේ ඌව පළාත තුළ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.)

1.3 යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.4 2023.09.18 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

**02. අධ්‍යාපන සුදුසුකම් :-**

2.1 අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.2.1 වගන්තියේ සටහන 6 ප්‍රකාරව අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබීම.

2.2 ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂ කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් (දේශීය/විදේශීය) විශ්ව විද්‍යාලයක් මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබිය යුතු අතර, එම උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයයන් වලට අනුකූලව එක් එක් විෂයය සඳහා මෙම නිවේදනයේ උපලේඛන අංක 01 යටතේ ඇති සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

2.3 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය / විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය. ඉල්ලුම් කරනු ලබන විෂයයට අදාළව ස්වකීය උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් (credit සංඛ්‍යාවෙන්) 1/3ක් සම්පූර්ණ කළ අයවලුන් විය යුතුය.

2.4 උපාධියෙහි විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙහි විෂයය සන්ධාරය සඳහන් නොවේ නම් එය අදාළ විශ්ව විද්‍යාලය මගින් තහවුරු කර අදාළ ලේඛන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

2.5 උපාධියෙහි විෂයය සන්ධාරය පිළිබඳව ඇති වන ගැටළු සම්බන්ධයෙන් අවසන් තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**03. සේවා කොන්දේසි :-**

3.1 මෙම තනතුර ස්ථිර ය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

3.2 මුලින් පත් කරන පාසලේ වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

3.3 වසර 05 ක සේවා කාලයකට පසු ඌව පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව සේවා අවශ්‍යතාවය මත ඌව පළාතේ වෙනත් පාසලකට ස්ථාන මාරුවීම් ලබා දීමට ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සලකා බලනු ඇත.

3.4 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

3.5 මෙම උපාධිධාරීන් ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - I (අ) ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, **2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016(iv) හි GE-1-2016 - ඒ වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු.31,490/- 445x6 - 525x7 - 600x2 - 39,035/-** මාසික වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු: 37,835/- වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 04. බඳවා ගැනීමේ ක්‍රමය :-

4.1 අයදුම්පත් ඉදිරිපත් කරන ලද සියලුම අයදුම්කරුවන් උදෙසා ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. නමුත් එක් එක් විෂයය සඳහා ඇබෑර්තු ප්‍රමාණය හා ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අනුව විභාගයට ඉදිරිපත් කිරීමේ හෝ නොකිරීමේ තීරණය ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. ලිඛිත තරඟ විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ කුසලතාවය අනුපිළිවෙලට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණය (03)කට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හා ඉගැන්වීමේ හැකියාව මැන බැලීම සඳහා පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ලිඛිත තරඟ විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පාසල් පාදකව සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.2 ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලබන අතර අයදුම්කරුවන් විසින් පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය මනාපය ප්‍රමුඛතා අනුපිළිවෙළින් දැක්විය යුතුය.

4.3 ලිඛිත තරඟ විභාගයෙන් සමත් අයදුම්කරුවෙකු වෙත පාසල් පාදක ක්‍රමය යටතේ පාසලක් නොලැබුණහොත් ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව, පාසල් පාදක ක්‍රමය යටතේ කිසිදු අයදුම්කරුවෙකු අයදුම් නොකළ පුරප්පාඩු පාසලක් වේ නම් ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

4.4 එකම පාසලට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක දී පාසල් සඳහා ස්ථානගත කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

4.5 මෙම නිවේදනයට අනුව බඳවා ගන්නා ලද සෑම අයදුම්කරුවෙකුටම ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2 වගන්තිය ප්‍රකාරව දින විසි එකක (21) සමාරම්භක පුහුණුවක් (නේවාසික) ලබා දෙනු ලැබේ.

4.6 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

4.7 **ප්‍රායෝගික පරීක්ෂණය :**

ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලේ. ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් නිර්ණායක පදනම් කොට ගෙන මේ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

4.8 එමෙන්ම මෙම බඳවා ගැනීමේ නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වේතොත් එම කරුණු සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

## 05. අයදුම් කළ යුතු පිළිවෙල :-

5.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. අයදුම්පතේ ඒ ඒ ශීර්ෂයන් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 06 දක්වා කොටස් පළමු පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත් වන සේ අයදුම්පත සැකසිය යුතුය.

5.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.09.18 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **"ලේකම්, ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ඌව පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023"** යනුවෙන් සහ ඔබ අයදුම් කරන විෂයය හා විෂයය අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

5.3 දැනටමත් ඌව පළාත් රාජ්‍ය සේවයේ හෝ මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

5.4 අයදුම්කරුවෙකුට එක් විෂයයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම් කරනු ලබන විෂයය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. පුරප්පාඩු විෂයය ලේඛනය අනුව අයදුම් කරනු ලබන විෂයය හා විෂයය කේත අංකය, අයදුම්පතේ අදාල ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.5 එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන අතර, ඌව පළාතේ පවතින ඕනෑම පාසලක සේවය කිරීම සඳහා අයදුම්කරු එකඟ විය යුතු වේ.

5.6 නියමිත ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන, විභාග හා පරිපාලන ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර වෙබ් අඩවියෙහි දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවම ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීමකි. අයදුම්පත තැපෑලේදී නැති වීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**5.7 අත්සන සහතික කිරීම :**

**5.7.1 පළාත් රාජ්‍ය සේවයේ / මධ්‍යම රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-**
අයදුම්පතෙහි ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවෙකු තම අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

**5.7.2 රාජ්‍ය සේවයේ නොසිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-**
අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු / කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු / සාමදාන විනිශ්වයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 47,615/- ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**06.** විභාග හා පරිපාලන ගාස්තු :-

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු.1250/- කි. මෙම මුදල *ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත* මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

**07. විභාග පටිපාටිය සහ තරඟ විභාගයේ විෂයය නිර්දේශය :-**

7.1 බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් ඒ පිළිබඳව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එහිදී ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 තරඟ විභාගය බදුල්ල නගරයේදී පමණක් පැවැත්වෙනු ඇත.

7.3 නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

7.4 විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

7.5 තරඟ විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පතක් නිකුත් කිරීම, අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

7.6 මෙම තරඟ විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.7 ලිඛිත තරඟ විභාගය බහුවරණ හා කෙටි පිළිතුරුවලින් සමන්විත පහත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) සඳහාම පෙනී සිටිය යුතුය.

**01. අභියෝග්‍යතාව - කාලය පැය 01 - ලකුණු 100**

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**02. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 - ලකුණු 100**

ගුරු ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම, දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

තරඟ විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත යුතුය.

7.8 **ප්‍රායෝගික පරීක්ෂණය : කාලය - විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.**
**- උපරිම ලකුණු 25**

අයදුම්කරු විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයට අදාළව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත සඳහන් නිර්ණායකයන් ඔස්සේ ලකුණු හිමි වේ. මෙම පරීක්ෂණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | නිර්ණායකයන්හි අරමුණ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ඨ වීම | සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිෂ්ඨ වීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම. | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් / ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම. | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | | 25 | 10 |

- ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් **ලකුණු 02** බැගින් ලබා ගත යුතුය.

**08.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

**09.** එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාර ගනු නොලැබේ.

**10. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**11.** මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳ අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

**12.** සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

## උපලේඛන අංක 01 - විෂය පුරප්පාඩු ලේඛනය

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් | මාධ්‍යය | |
|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ |
| 1 | රසායන විද්‍යාව | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂයය ලෙස,<br>හෝ<br>අනෙක් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු උපාධියක දී මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අවම වශයෙන් අදාළ විෂයයයෙන් සම්පූර්ණ කර තිබීම. | 10 | 02 |
| 2 | භෞතික විද්‍යාව | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂයය ලෙස,<br>හෝ<br>අනෙක් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු උපාධියක දී මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අවම වශයෙන් අදාළ විෂයයයෙන් සම්පූර්ණ කර තිබීම. | 11 | 01 |
| 3 | ජීව විද්‍යාව | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂයය ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හදාරා තිබීම හා ප්‍රධාන විෂයය උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව වන විට අනෙක් විෂයයක් ලෙස සත්ත්ව විද්‍යාව ද ප්‍රධාන විෂයය සත්ත්ව විද්‍යාව වන විට අනෙක් විෂයය ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව ද අවම වශයෙන් වසර දෙකක දී වත් උසස් පෙළ විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් දෙකෙහිම එකතුව, මුළු විෂයය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් බැගින් උසස් පෙළ විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම. | 12 | 01 |
| 4 | කෘෂි විද්‍යාව | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය,<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය,<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය,<br>විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිය,<br>විද්‍යාවේදී අපනයන කෘෂිකර්ම උපාධිය<br><br>ඉහත නම් සඳහන් උපාධි<br>හෝ<br><br>උසස් පෙළ කෘෂි විද්‍යා විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම. | 04 | 01 |

| විෂයය ක්ෂේත්‍ර අංකය | විෂයය | සුදුසුකම් | මාධ්‍යය | |
|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ |
| 5 | සංයුක්ත ගණිතය | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂයය ලෙස ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හදාරා තිබීම හා ප්‍රධාන විෂයය ව්‍යවහාරික ගණිතය වන විට අනෙක් විෂයය ලෙස ශුද්ධ ගණිතය ද, ප්‍රධාන විෂයය ශුද්ධ ගණිතය වන විට අනෙක් විෂයය ලෙස ව්‍යවහාරික ගණිතය ද අවම වශයෙන් වසර දෙකක දී වත් හදාරා තිබීම,<br>හෝ<br>තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙහිම එකතුව, මුළු විෂයය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් බැගින් හදාරා තිබීම. | 12 | 02 |
| 6 | ඉංජිනේරු තාක්ෂණවේදය | උපාධියෙහි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් සහිතව ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් යන විෂයය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි උපාධිය සම්පූර්ණ කර තිබීම,<br>හෝ<br>ඉංජිනේරු උපාධිය (ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හා/හෝ ඉලෙක්ට්‍රොනික්) ලබා තිබීම. | 06 | - |
| 7 | ජෛව පද්ධති තාක්ෂණවේදය | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය,<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය,<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය,<br>ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය<br>ඉහත නම් සඳහන් උපාධි<br>හෝ<br>උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම. | 04 | - |
| 8 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | විද්‍යාවේදී උපාධියෙහි පවතින මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් භෞතික විද්‍යාව අන්තර්ගත වන උපාධියක් හදාරා තිබීම. | 06 | - |
| 9 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක්,<br>හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස ඇති උපාධියක්, උපාධි පාඨමාලාවට අයත් මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයට අයත් විය යුතු යුතුය. | 02 | - |
| 10 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | ළමා මනෝ විද්‍යාව විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක්,<br>හෝ<br>ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 01 | 01 |
| 11 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධිය,<br>හෝ<br>සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 01 | 01 |
| 12 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) විශේෂ උපාධිය,<br>හෝ<br>ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 02 | - |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් | මාධ්‍යය | |
|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ |
| 13 | ශිල්ප කලා | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා, රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී),<br>හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්),<br>හෝ<br>දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය,<br>හෝ<br>ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම (චිත්‍ර/ග්‍රැෆික්/මූර්ති/දෘශ්‍ය හා තාක්ෂණික කලා යන විෂයයන් හෝ එක් විෂයයක් හෝ ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය.) | 01 | 01 |
| 14 | අභ්‍යන්තර නිර්මාණකරණය | ගෘහ නිර්මාණ ශිල්පය සඳහා වූ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>නිර්මාණවේදී උපාධිය,<br>හෝ<br>ගෘහ නිර්මාණ ශිල්පය සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය,<br>හෝ<br>අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 02 | - |
| 15 | ග්‍රැෆික් නිර්මාණකරණය | නිර්මාණවේදී උපාධිය,<br>හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර සහ ග්‍රැෆික්),<br>හෝ<br>පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය,<br>හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය<br>හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඇතුළත් උපාධියක්,<br>හෝ<br>පරිගණක විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>(ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක වටිනාකමකින් යුතු ග්‍රැෆික් නිර්මාණකරණය සහිත විෂයය කොටස් හදාරා සමත් වී තිබිය යුතුය.)<br>ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 01 | - |
| 16 | භූ දර්ශන නිර්මාණකරණය | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී උද්‍යාන විද්‍යාව/භූ දර්ශන නිර්මාණකරණය විෂයයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 02 | - |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් | මාධ්‍යය | |
|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ |
| 17 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී උද්‍යාන විද්‍යාව/භූ දර්ශන නිර්මාණකරණය විෂයයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>ව්‍යවහාරික උද්‍යාන විද්‍යාව ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 01 | - |
| 18 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියක දී සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම,<br>හෝ<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය<br>හෝ<br>සත්ත්ව නිෂ්පාදන හා ආහාර තාක්ෂණය/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 02 | - |
| 19 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | ආහාර විද්‍යාව හා තාක්ෂණ උපාධිය,<br>හෝ<br>ආහාර විද්‍යා හා පෝෂණය පිළිබඳ උපාධිය,<br>හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී ආහාර විද්‍යාව/ආහාර නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම,<br>හෝ<br>ආහාර නිෂ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 02 | 01 |
| 20 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය/ජලජ සම්පත් තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ධීවර හා සාගර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 01 | - |
| 21 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | අපනයන කෘෂිකර්මය පිළිබඳ උපාධිය,<br>හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී වැවිලි භෝග/වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරා තිබීම,<br>හෝ<br>වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 03 | - |
| 22 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික),<br>හෝ<br>විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය,<br>හෝ<br>මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 03 | - |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් | මාධ්‍යය | |
|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ |
| 23 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ වෙනත් ඕනෑම උපාධියක්<br>හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අවුරුදු 02ක් හෝ ඊට වැඩි පාඨමාලා කාලයක් සහිතව හෝ අවම වශයෙන් NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමේ ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. | 02 | - |
| 24 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය,<br>හෝ<br>ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය,<br>හෝ<br>විදුලි හෝ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 02 | - |
| 25 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | නිර්මාණවේදී උපාධිය,<br>හෝ<br>පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු විද්‍යා ප්‍රථම උපාධිය,<br>හෝ<br>තාක්ෂණවේදී උපාධිය,<br>හෝ<br>පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 03 | - |
| 26 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය (යාන්ත්‍රික),<br>හෝ<br>යාන්ත්‍රික තාක්ෂණවේදය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ සාමාන්‍ය උපාධිය,<br>හෝ<br>ලොහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක්,<br>හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ලෝහ සැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම. | 01 | - |
| 27 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය (සිවිල්/ඉදිකිරීම්/යාන්ත්‍රික),<br>හෝ<br>ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක්,<br>හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම. | 02 | - |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් | මාධ්‍යය | |
|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ |
| 28 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය | වසර තුනක පාඨමාලා කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන්ට අදාලව විෂයය කොටස් හදාරා තිබීම),<br>හෝ<br>වසර හතරක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන්ට අදාලව විෂයය කොටස් හදාරා තිබීම),<br>හෝ<br>පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී/තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම හා එහි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක වටිනාකමක් සහිතව පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර හදාරා සමත් වී තිබීම.<br><br>විෂයය ක්ෂේත්‍ර -<br><br>I. Computer Hardware<br>II. Computer System Engineering<br>III. Computer Networks<br>IV. Computer Architecture<br>V. Operating System<br>VI. Electronics<br>VII. Arduino Technology<br>VIII. IT Security<br>IX. Network Security<br>X. Information Security<br>XI. Cyber Security<br>XII. Computer Hardware And Network Related Projects | 02 | - |
| 29 | නිෂ්පාදනය | වසර තුනක කාලයකින් යුත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම. | 01 | - |
| 30 | සංචරණය හා ආගන්තුක සත්කාර | විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය,<br>හෝ<br>විද්‍යවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය,<br>හෝ<br>ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණයය පිළිබඳ පරිපාලනවේදී උපාධිය,<br>හෝ<br>ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි කළමනාකරණ උපාධිය,<br>හෝ<br>සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය,<br>හෝ<br>සංචාරක කළමනාකරණ උපාධිය,<br>හෝ<br>සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය,<br>හෝ<br>සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම. | 03 | - |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් | මාධ්‍යය | |
|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ |
| 31 | විශේෂ අධ්‍යාපනය | විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ උපාධියක්,<br>හෝ<br>අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ උපාධියක්,<br>හෝ<br>විද්‍යාවේදී කථන හා ශ්‍රවණ විද්‍යා උපාධියක් තිබීම. | 36 | 06 |
| එකතුව | | | 141 | 17 |

කොමිෂන් සභාවේ නියමය පරිදි,

(එච්.එම්. ජීවන්ත හේරත්)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2023.08.29 වන දින.
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 14/4, පීලිපොතගම පාර,
පිං අරාව, බදුල්ල.